# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන)

**2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

**[215 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

**2 වන වගන්තිය :** මේ වගන්තිය මඟින් 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත සිදු කරනු ලබන ඛනිජ තෙල් මෙහෙයුම් වල දී ගබඩා කිරීම, සකස් කිරීම, අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හෝ අපනයනය කිරීම සඳහා භාවිත කිරීම සඳහා බන්ධිත පහසුකමක ඇති උපකරණ, මෙවලම්, ද්‍රව්‍ය, පාරිභෝගික වරාය හා ගුවන්තොටුපල බද්දෙන් නිදහස් කිරීම වේ.

**3 වන වගන්තිය :** මේ වගන්තිය මගින් වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනතේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතියේ බලපෑම වනුයේ 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයන්ගේ වලංගුභාවය දීර්ඝ කිරීම වේ.

# වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 12/2013.

**2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක     දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''(අ) පිරිසැකසුම් කොට ප්‍රති අපනයනය කිරීමේ කාර්ය සඳහා ;

(ආ) අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් අමු ද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීම සඳහා ; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිදු කරනු ලබන ඛනිජ තෙල් මෙහෙයුම්වල දී භාවිත කිරීම සඳහා බන්ධිත පහසුකමක ඇති උපකරණ, මෙවලම්, ද්‍රව්‍ය, පාරිභෝගික ද්‍රව්‍ය වන අවස්ථාවෝචිත පරිදි, ගබඩා කිරීම, සකස් කිරීම, අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හෝ අපනයනය කිරීම සඳහා,

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් භාණ්ඩයක පිරිවැය රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් කිසිදු බද්දක් අය කරනු නොලැබිය යුතුය.

(ඈ) ඡේදයේ කාර්යය සඳහා ''ඛනිජ තෙල් මෙහෙයුම්'' යන්නට 2003 අංක 26 දරන ඛනිජ තෙල් සම්පත් පනත යටතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතුය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටස අදාළ නොවිය යුතු බව.

"16. (1) වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද ගෙවීමට අදාළව 2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ විධිවිධාන 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව, ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන සහ ශ්‍රී ලංකාවට ආනයනය කරන කිසිදු භාණ්ඩයකට අදාළ නොවිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු ගෙවීමෙන් යම් නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩ නිදහස් කරමින් ; සහ

(ආ) අනුග්‍රාහක අනුප්‍රමාණයක් අය කල යුතු බවට සහ පැනවිය යුතු බවට නිශ්චිතව දක්වමින්,

2002 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සහ 2011 ජනවාරි මස 1 දිනට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, සෑම නියමයක් ම, 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම නියමය අඛණ්ඩව බලපවත්වනු ලැබිය යුතුය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.